ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2018 පෙබරවාරි 27 යොමු අංකය 1718-028

දයාබර දෙමව්පියන් වෙත,

**<u>සිඟිති අලුත් අවුරුදු උත්සවය 2018 - සමාරම්භක හමුවීම</u>**

ඔබ සැමගේ දායකත්වයෙන්, 70 වැනි නිදහස් උත්සවය සැමරීම සමග ශ්‍රී ලංකා දිනය 2018 උත්සවය ඉතාමත් සාර්ථක ලෙස අවසන් කොට අප දැන් අපේ මීළඟ ජාතික උත්සවය වන “සිඟිති අලුත් අවුරුදු උත්සවය 2018” වෙත ඉතා සීඝ්‍රයෙන් ලඟාවෙමින් පවතී. ඔබ සැම හොඳින් දන්නා පරිදි මෙම උත්සවහි මූලික අරමුණ වන්නේ අප දරු දැරියන් හට අපේ සිරිත් විරිත්, සමාජ සාරධර්ම, යුතුකම් සහ වගකීම් පිළිබඳ ප්‍රායෝගික ලෙස පුරුදු පුහුණු වීමට අවස්ථාවක් ලබාදීමයි.

අප දහම් පාසලේ දරු දැරියන් හට මෙම උත්සවය සුවිශේෂී කරවනු වස් ඔබගේ වටිනා අදහස්, උදහස් සහ උපකාර ශ්‍රම දායකත්වය අප ඉතා අගය කරමු. ඒ සඳහා කටුයුතු සාකච්චා කිරීමට විශේෂී හමුවක් මාර්තු 2 වැනිදා සිකුරාදා පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙම රැස්වීමට සහභාගී වීම පිණිස ඔබගේ පහසුව සඳහා උදය වරුවේ, දහවල් වරුවේ සහ සවස් වරුවේ දෙමාපියන් හට රැස්වීම් තුනක් පැවැත්වීමට සුදානම් කර ඇත. කරුණාකර පහත සඳහන් වේලාවන් අනුව මෙම රැස්වීම වලට සහභාගී වී ඔබගේ සහයෝගය අපට ලබා දෙන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු.

උදය වරුවේ දෙමාපියන්: මාර්තු 2 සිකුරාදා පෙ.ව. 8.30 ට (උදෑසන බුද්ධ වන්දනාවෙන් පසුව)

දහවල් වරුවේ දෙමාපියන්: මාර්තු 2 සිකුරාදා පෙ.ව. 12.30ට (දහවල් බුද්ධ වන්දනාවෙන් පසුව)

සවස් වරුවේ දෙමාපියන්: මාර්තු 2 සිකුරාදා ප.ව. 4.15ට (පාසල අවසාන වීමට පෙර)

දහම් පාසල් පරිශ්‍රයේදී මෙම හමුවීම පැවැත්වෙනු ඇත.

ඔබගේ කාරුණික පැමිණීම සහ සහයෝගය උදෙක්ම අපේක්ෂා කරමු.

ස්තුතියි,
සංවිධායක කමිටුව